ෆැක්ස්
தொலைநகல்
Fax } 2323730

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail } cabsecsl@sltnet.lk

වෙබ් අඩවිය
வெப் தளம்
Web Site } www.CabinetOffice.gov.lk

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

ජනරජ චතුරශ්‍රය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
குடியரசுச் சதுக்கம், சேர் பாரோன் ஜயதிலக்க மாவத்தை, கொழும்பு 01.
Republic Square, Sir Baron Jayathilaka Mawatha, Colombo 01.

මගේ අංකය / எனது இல. / My No. 09/1041/36 0/034

ඔබේ අංකය / உமது இல. / Your No.

ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව**
**<u>යටතට ගැනෙන ආයතන කටයුතු සඳහා වූ අතුරු පියවර</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව නිසි පරිදි ප්‍රතිසංස්ථාපනය කරනු ලබනතුරු, අතුරු පියවරක් වශයෙන්, ශ්‍රී ලංකා පොලිස් සේවය ඇතුළුව, රාජ්‍ය සේවයේ ආයතන කටයුතු පිළිබඳ ක්‍රියා කිරීමේදී පහත දක්වා ඇති ක්‍රියා පරිපාටිය අනුගමනය කරන ලෙස සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දීමට 2009.06.17 දින පැවැත්වුණු සිය රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් දෙන ලදී. මේ අනුව ක්‍රියා කරන මෙන් කරුණාවෙන් දන්වමි.

**(අ) පත්කිරීම්, උසස් කිරීම් හා ස්ථානමාරු කිරීම්:**

(i) දීපව්‍යාප්ත සේවාවන් ඇතුළුව මාණ්ඩලික ශ්‍රේණිවල සියළුම පත්කිරීම්, අදාළ සේවා ව්‍යවස්ථාවන් හි අනුමත කාර්ය පරිපාටි සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 36 හා 36(i) හි දැක්වෙන මාර්ගෝපදේශ අනුගමනය කරමින්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/පරිපාලන බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

(ii) රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරුවලට බඳවා ගැනීම් සඳහා වන හදිසි අවශ්‍යතා, පවත්නා සේවා ව්‍යවස්ථාවන්/බඳවා ගැනීමේ පරිපාටි අනුගමනය කරමින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006 ප්‍රකාරව, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් අදාළ වැටුප් පරිමාණ හඳුනාගෙන කළ යුතුය. ඒ අතරතුර, ආයතන අධ්‍යක්ෂ ජනරාල් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකගත්වය මත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006 ප්‍රකාරව, අදාළ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.



ලේකම් / செயலாளர் / Secretary } 2329620
අතිරේක ලේකම් / மேலதிகச் செயலாளர் / Additional Secretary } 2325279
ප්‍රධාන ලිපිකරු / பிரதம இலிகிதர் / Chief Clerk } 2422438

(iii) අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් පත්කිරීම, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කළ යුතුය.

(iv) දිපව්‍යාප්ත සේවාවල හැර රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරුවල උසස්වීම්, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකගත්වය මත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006 ප්‍රකාරව, අදාළ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර ගැනීමෙන් අනතුරුව, තනතුරේ සේවා ව්‍යවස්ථාවේ/බඳවා ගැනීමේ පරිපාටියේ ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින්, අදාළ පත්වීම් බලධාරීන් විසින් සිදු කළ යුතුය. දිපව්‍යාප්ත සේවාවල උසස්වීම් ලබාදීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

(v) පොලිස් සේවයට බඳවා ගැනීම්, මහා භාණ්ඩාගාරයේ සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ඇතිව පොලිස්පති විසින් සිදු කළ යුතුය. කෙසේ වුවද, සහකාර පොලිස් අධිකාරී සේවයට බඳවා ගැනීමේදී එවැනි පත්වීම් කිරීමට පෙර අදාළ සියළු විස්තර සපයමින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

(vi) සහකාර පොලිස් අධිකාරී ශ්‍රේණියට සහ ඉන් ඉහළ ශ්‍රේණිවලට උසස්වීම් ලබාදීම පිණිස ද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

(vii) රාජ්‍ය සේවයේ ස්ථානමාරු කිරීම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය වී ඇති පරිදි, ආයතන සංග්‍රහයේ දැක්වෙන පටිපාටි අනුගමනය කරමින් අදාළ අමාත්‍යාංශ ලේකම්/පරිපාලන බලධාරී විසින් කළ යුතුය.

(ආ) විනය ක්‍රියා මාර්ග:

(i) රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්ට එරෙහිව සිදු කරන විනය ක්‍රියා මාර්ග, ආයතන සංග්‍රහයේ සහ අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දැක්වෙන පරිදි අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/පරිපාලන බලධාරීන් විසින් සිදුකළ යුතුය. කෙසේවුවද, විධිමත් විනය පරීක්ෂණයකින් පසුව චෝදනා ඔප්පුවී ඇති අවස්ථාවකදී දඬුවම් පැනවීම හෝ වරදකරුවී නොමැති අවස්ථාවක චෝදනාවලින් නිදොස්කොට නිදහස් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් හා සම්බන්ධ විනය නියෝගවලට එරෙහිව කෙරෙන සියළු අභියාචනා, අදාළවන පරිදි, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ/පරිපාලන බලධරයාගේ වාර්තාවක් සහිතව, අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

(ඇ) සේවා දීර්ඝ කිරීම්, විශ්‍රාම ගැන්වීම් සහ නැවත සේවයේ යෙදවීම්:

(i) වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම්, අනුමත ක්‍රියා පරිපාටි අනුගමනය කරමින්, අදාළ අමාත්‍යවරයා විමසමින්, අදාළ අමාත්‍යාංශ ලේකම්/පරිපාලන බලධරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්හට වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීම් ලබා නොදීම සම්බන්ධයෙන් වන අභියාචනා, සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මේ දක්වා කටයුතු කරන ලද රාජ්‍ය නිලධරයන්ගේ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම්, අවස්ථාවෝචිත පරිදි, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/පරිපාලන බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතුය. විනය ක්‍රියා මාර්ග අරඹා ඇති අවස්ථාවලදී, එවැනි විශ්‍රාම ගැන්වීම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/පරිපාලන බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 24/2007 සහ 24/2007-I ප්‍රකාරව ප්‍රයෝජනයට නොගත් නිවාඩු වෙනුවෙන් නැවත සේවයේ යෙදවීම පිණිස සියළුම නිලධාරීන් විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන්, අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

(iv) විශ්‍රාමික මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු හෝ මාණ්ඩලික නොවන ශ්‍රේණියේ නිලධරයෙකු පුරප්පාඩු තනතුරක නැවත සේවයේ යෙදවීම පිණිස ඉල්ලීම් කළ යුත්තේ, එකී තනතුරට ස්ථිර පදනම මත හෝ වැඩබැලීමේ පදනම මත හෝ කාර්යයේ නියුක්තවීමේ පදනම මත, පත්කිරීම පිණිස සුදුසු නිලධරයෙකු සොයා ගැනීමට නොහැකි අවස්ථාවකදී පමණක් වන අතර, එවැනි ඉල්ලීම් සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය (පුරප්පාඩු තනතුරක විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ යෙදවීම පිණිස කරනු ලබන කවර හෝ ඉල්ලීමක්, එකී තනතුරට ස්ථිර පදනම මත පත්කිරීම පිණිස නිලධරයෙකු නොමැති බවට අදාළ පත්වීම්/පරිපාලන බලධරයාගේ සහතිකයක් සමග ඉදිරිපත් කළ යුතුය).

(ඈ) රාජ්‍ය නිලධරයන්ගේ ඉල්ලා අස්වීම් සහ සේවයෙන් මුදා හැරීම්:

(i) සාමාන්‍ය අවස්ථා යටතේ රාජ්‍ය නිලධරයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ක්‍රියා කරනු ඇත. කෙසේ වුවද, විනය ක්‍රියාමාර්ග අරඹා ඇති නිලධරයන්ගේ ඉල්ලා අස්වීම්, ඒ පිළිබඳ තීරණයක් ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයන් වෙනත් ආයතනවලට, ව්‍යාපෘතිවලට ආදිය මුදා හැරීම, ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ අදාළ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් සිදුකළ යුතුය. පවත්නා මාර්ගෝපදේශ මාලාවට පරිබාහිරව වන කවර හෝ අවස්ථා, සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

(ඉ) එතෙර නිවාඩු:

(i) විනය ක්‍රියාමාර්ග අරඹා ඇති නිලධරයන්ගේ එතෙර නිවාඩු සඳහා වන ඉල්ලීම්, සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඊ) පැවරුණු බලතල:

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අමාත්‍යාංශ ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානින් ආදීන්ට දැනටමත් පවරා ඇති බලතල තවදුරටත් එලෙසම පවතිනු ඇත.

(උ) මෙම උපදෙස් මාලාවේ සඳහන්කොට නොමැති වෙනත් කවර හෝ කරුණු පිළිබඳව, සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

ඩී.විජේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2009 ජුනි මස 25 දින.